**ඉන්දියානු නාවික හමුදාවට අයත් 'ත්‍රිකාන්ඩ්' යුද්ධ නෞකාව කොළඹ වරායට පැමිණේ.**

ඉන්දියානු නාවික හමුදාවට අයත් 'ත්‍රිකාන්ඩ්' නෞකාව අද (ජුලි 07) සුහදතාවය වර්ධනය කර ගැනීමේ සංචාරයක් සඳහා කොළඹ වරායට සේන්දු විය. එහිදී නාවික සම්ප්‍රදායානුකූලව ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් එම නෞකාව පිළිගන්නා ලදී.

කොළඹ වරායට පැමිණීමෙන් අනතුරුව නෞකාවේ අණදෙන නිලධාරී කපිතාන් උපාල් කුණ්ඩු සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයේ සහකාර ආරක්ෂක උපදේශක ලුතිනන් කර්නල් රවී ශේකර් මිශ්‍රා යන මහත්වරුන්, බටහිර නාවික විධාන මූලස්ථානයේ දී, බටහිර නාවික විධානය භාර ආඥාපති, රියර් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා හමුවිය. එහිදී ඔවුන් ද්වි පාර්ශ්වික වශයෙන් වැදගත් කරුණු කිහිපයක් සම්බන්ධයෙන් සුහද පිළිසඳරක නිරත වූ අතර, එම අවස්ථාව සනිටුහන් කරමින් සමරු තිළිණ හුවමාරුවක් ද සිදු කෙරිණි.

තවද, නාවික හමුදා මාණ්ඩලික ප්‍රධානී, රියර් අද්මිරාල් පියල් ද සිල්වා මහතා ඉන්දියානු 'ත්‍රිකාන්ඩ්' යුද්ධ නෞකාවේ චාරිකාවක නිරතවූ අතර, එම අවස්ථාව සඳහා බටහිර නාවික විධානය භාර ආඥාපති, රියර් අද්මිරාල් නිශාන්ත උළුගේතැන්න මහතා, අධ්‍යක්ෂ නාවික මෙහෙයුම් කොමදෝරු සංජීව ඩයස් මහතා සහ නාවික හමුදා මූලස්ථානයේ නිලධාරීන් කිහිපදෙනෙකු ද සහභාගිවිය.

දින 3 ක සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි නෞකාවේ කාර්යය මණ්ඩලය ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සංවිධානය කරනු ලබන සුහද පාපන්දු තරඟයකට ද සහභාගී වන අතර. ඒ අනුව එම නෞකාව එළඹෙන ජුලි මස 09 වන දින දිවයිනෙන් පිටත් වීමට නියමිතය.